**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 2**
**CINGALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 2**
**CINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 2**

Wednesday 22 May 2002 (morning)
Mercredi 22 mai 2002 (matin)
Miércoles 22 de mayo de 2002 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied. You may include in your answer a discussion of a Part 2 work of the same genre if relevant. Answers which are not based on a discussion of at least two Part 3 works, will not score high marks.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- Ne pas ouvrir cette épreuve avant d'y être autorisé.
- Traiter un seul sujet de composition. Vous devez baser votre réponse sur au moins deux des œuvres de la 3^e^ partie que vous avez étudiées. Le cas échéant, vous pouvez inclure dans votre réponse une discussion sur une œuvre du même genre littéraire étudiée dans la 2^e^ partie du programme. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la 3^e^ partie n'obtiendront pas une note élevée.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Elija un tema de redacción. Su respuesta deberá basarse en al menos dos de las obras estudiadas en la Parte 3. Se podrán hacer comentarios sobre una obra de la Parte 2 del mismo género, si fuera necesario. Las respuestas que no incluyan una discusión sobre al menos dos obras de la Parte 3 no recibirán notas altas.

2 පත්‍රය - රචනා ප්‍රශ්න

පහත සඳහන් මාතෘකා අතුරින් එකක් යටතේ වාක්‍ය රචනයක් ලියන්න. 3 වන කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතු ය. අදාළ නම් 2 වන කොටසේ ග්‍රන්ථ අතුරින් එම සාහිත්‍යාංගයටම අයත් කිසියම් කෘතියක් ගැන වුව ද පිළිතුරේ දී සාකච්ඡා කළ හැකිය. 3 වන කොටසින් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන නොමැති පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.

සම්භාව්‍ය සාහිත්‍යය

1. එක්කෝ

(අ) සාහිත්‍යය පැරණි විය හැකිය. එහෙත් එය කිසි විට යල් පනින්නක් නොවේ. ඔබ හදාරා ඇති කෘති දෙකක් සසඳමින් මේ කියමන පරීක්ෂා කරන්න.

නැතහොත්

(ආ) ඔබ හදාරා ඇති සම්භාව්‍ය කෘති අතුරින් දෙකක් තෝරා ගෙන ඒවායේ වඩාත් ම වැදගත් සාහිත්‍ය ලක්ෂණ සේ පෙනෙන කරුණු සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න.

නාට්‍ය කලාව

2. එක්කෝ

(අ) නාට්‍යයක් මගින් කථා පුවතක සියලු සිද්ධි නිරූපණය කළ නොහැකිය. එබැවින් කිසියම් ලෙසකින් සිද්ධි තෝරා ගත යුතු වේ. ඔබ හදාරා ඇති කෘති දෙකක මේ තේරීම කෙතරම් සාර්ථක ලෙස සිදුවේද යන්න සංසන්දනාත්මකව විමසන්න.

නැතහොත්

(අ) ඔබ හදාරා ඇති නාට්‍ය කෘති දෙකක සංවාද භාෂාවේ දක්නට ලැබෙන විශේෂතා සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න. එම විශේෂතා මගින් ඉටුවන කාර්යයද පරීක්ෂා කරන්න.

## නවකථාව

3. එක්කෝ

(අ) ඔබ හදාරා ඇති නවකථා අතුරින් දෙකක ප්‍රධාන තේමාව හෝ තේමාවන් හඳුනාගෙන ඒවා ප්‍රකාශ කිරීමට යොදා ගෙන ඇති උපක්‍රමයන් හා ඒවායේ සාර්ථකත්වය සංසන්දනාත්මකව පරීක්‍ෂා කරන්න.

නැතහොත්

(ආ) ඔබ හදාරා ඇති නවකථා අතුරින් දෙකක රචකයන් ස්වකීය නිර්මාණයට යොදා ගෙන ඇති පසුතලය එම නිර්මාණයට කොතෙක් දුරට යෝග්‍ය වේද, එය එම කෘතිවල සාර්ථකත්වයට දායක වී තිබේද යන්න පරීක්‍ෂා කරන්න.

## කාව්‍යය

4. එක්කෝ

(අ) හොඳ කාව්‍යය නිර්මාණයක වචනයෙන් කියවන දෙයට වඩා වැදගත් කාර්යභාරයක් ඇඟවෙන අරුත් මගින් ඉටු කරනු ලැබේ. ඔබ හදාරා ඇති කාව්‍ය නිර්මාණවල ඇඟවෙන අරුත් ජනිත වන ආකාරය විමසමින් පූර්වෝක්ත නිගමනය පරීක්‍ෂා කරන්න.

නැතහොත්

(ආ) කාව්‍ය නිර්මාණයක ආකෘතික ලක්‍ෂණ තීරණය වනුයේ කවියාට පවසන්නට ඇති කවි සංකල්පනාවන්ගේ ස්වභාවය අනුවය. ඔබ අගය කරන කවි පංති කීපයක් සසඳමින් මේ කියමන පරීක්‍ෂා කරන්න.

**කෙටි කතා**

5. **එක්කෝ**

(අ) කෙටි කතාවට ආවේණික වූ කෙටි බව නිසා රචකයන්ට මුහුණ පාන්නට සිදු වන අභියෝග කවරේ දැයි හඳුනාගෙන ඔබ කියවා ඇති කෙටි කතාවල එම අභියෝග ජය ගැනීම සඳහා ඔවුන් යොදා ගෙන ඇති උපක්‍රම කවරේ දැයි සංසන්දනාත්මකව පිරික්සන්න.

**නැතහොත්**

(ආ) කෙටි කතාවක රචකයාගේ අවධානය යොමු වන්නේ කිසියම් චරිතයක එක් ප්‍රධාන චරිතාංගයක් කෙරෙහි මිස සම්පූර්ණ චරිතය කෙරෙහි නොවේ. ඔබ හදාරා ඇති කෙටි කතා කිපයක චරිත නිරූපණය සසඳමින් මේ කියමනට එකඟ විය හැකි දැයි දක්වන්න.

**පොදු ප්‍රශ්න**

6.

**එක්කෝ**

(අ) පුද්ගලයන් අතර වයස් පරතරය වැඩිවන තරමට ඔවුන් අතර හට ගන්නා ගැටලුද වඩාත් සංකීර්ණ වෙයි. ඔබ කියවා ඇති පොත් අතුරින් දෙකක් තෝරාගෙන මේ අදහසට කෙතෙක් දුරට එකඟ විය හැකි දැයි විමසන්න.

**නැතහොත්**

(ආ) ඔබ හදාරා ඇති සාහිත්‍ය ග්‍රන්ථවල වැදගත් අදහස් හැටියට හඳුනා ගත හැක්කේ මොනවාද ? එම අදහස් පාඨකයා වෙත එත්තු යන ලෙස ඉදිරිපත් කිරීමට කතුවරු කවර උපක්‍රම යොදා ගනිත්ද ?

**නැතහොත්**

(ඇ) ලේඛකයාගේ පෞද්ගලික රුචි අරුචිකම් සහ චරිතයන් කෙරෙහි ඔහු දක්වන ආකල්ප නිසා සාහිත්‍ය නිර්මාණයක චරිත නිරූපණය බෙහෙවින් විචිත්‍ර විය හැකිය. ඔබ හදාරා ඇති ග්‍රන්ථ දෙකක් ඇසුරින් මේ කියමනෙහි සත්‍යාසත්‍යතාව පිරික්සන්න.

**නැතහොත්**

(ඈ) පුරුෂාධිපත්‍යට අවනත විමට සිදුවීමත්, ඒ තුළින් ස්ත්‍රිය කෙරෙහි හට ගන්නා මානසික ආතතියත් වර්තමාන සාහිත්‍යයේ එක් ප්‍රබල තේමාවක් වී ඇත. ඔබ හදාරා ඇති සාහිත්‍ය කෘති දෙකක් ඇසුරු කරමින් සංසන්දනාත්මකව පිරික්සන්න.

---